# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1961/28 - 2016 අප්‍රේල් මස 06 වැනි බදාදා - 2016.04.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

### ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් හා 1986 අංක 14 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 29 වෙනි වගන්තිය යටතේ වූ දැන්වීම.

පනතේ 29 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරන ලද යම් කෘෂි කාර්මික ඉඩමක් හෝ ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වූ දිනට පෙරාතුවම වූ දිනයෙහි එම ඉඩම හෝ ඉඩම් සම්බන්ධයෙන් සම්බන්ධතාවයක් දරූ සෑම තැනැත්තෙකුම, වර්ෂ 2016.05.06 දින සිට මසක් ඇතුළත එම ඉඩම සම්බන්ධයෙන් එම පනත යටතේ ගෙවිය යුතු මුළු වන්දිය හෝ ඉන් කොටසක් සඳහා තෙපිටපතකින් යුතු ලිඛිත හිමිකම් පෑමක්ද ඉදිරිපත් කරන ලෙස මෙයින් නියම කරන අතර, එම හිමිකම් පෑමෙහි පහත සඳහන් විස්තර දැක්විය යුතු යැයි නියම කරමි.

(අ) හිමිකම් පාන්නාගේ නම සහ ලිපිනය :-
(ආ) එම ඉඩමෙහිලා ඔහුගේ සම්බන්ධතාවයෙහි ස්වභාවය :-
(ඇ) ඔහුගේ හිමිකම් පෑමෙහි විස්තර සහ
(ඈ) ඒ වන්දියෙන් ඔහු හිමිකම්පාන ප්‍රමාණය.

සියළු හිමිකම් පෑමක්ම ලියා පදිංචි තැපෑලෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති වෙත යොමු කළ යුතු බව දන්වනු කැමැත්තෙමි.

ටී. ඒ. සුමනතිස්ස තාඹුගල,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ 07,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවතේ, අංක සී 82 හි,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ය.


1A - G 23275 — 56 (2016/04)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය

| අනු අංකය | විශේෂ්‍ය අංකය | ප්‍රකාශගේ නම | ඉඩමේ නම | දිස්ත්‍රික්කය | නම | ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අක්. | රූඩ්. | පර්. |
| 01 | කො/3334 | චාර්ලිස් හරින් ඇන්ඩෘ ප්‍රනාන්දු මහතා | සෙන්ට් පීටර්ස් එස්ටේට් | කළුතර | ඉංගිරිය | 284 | 2 | 09 |
| 02 | මා/138 | එක්ෂ්මී මැක්ෂිම් ඩයස් මිය | තිල්ලාවටවන ගම සහ ගොඩබැද්ද | හම්බන්තොට | තිල්ලාවටවන | 517 | 0 | 00 |
| 03 | කො/1353 | හපුවලානගේ දොන් එඩ්මන් මහතා | තෙම්පාන වත්ත (පිලිකඩ එස්ටේට්) | කුරුණෑගල | තෙම්පාන පිලැස්ස | 19 | 0 | 02 |

04 - 844

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.